# හෙළදිව් අබිදනවත.

මාතර

**කවිකුලතිලක සරණපාල**

**මහා ස්වාමිපාදයන් විසින්**

විරචිතයි.

---

පී. ජේ. කරුණාධර

විසින්

"විද්‍යාදර්ශී" යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදී.

---

# HELADIV ABIDANAWATA

EDITED BY

**Late Revd: Saranapala,**

OF

## MATARA.


PRINTED BY

**P. J. Karunadhara**

AT THE

*Vidyadarsa Press.*

**1917.**

# හෙළදිව් අබිදානමක.

## සමවබුනි සරණ.

1 සව් ලෙව් පව් අඳුරු හැර හෙළිකළ දිනි ඳු
සව් ලෙව් පව් ගිමන් සන්සිඳු දම්තරි ඳු
සව් ලෙව් පව් ලබිඳ සැඳැමල කල පුබු ඳු
සවි සවි කල් වඳිම් මේ **තෙරුවන්** සමි ඳු

2 සත ත බ ර ත් සිසි සිසිපුත් සු රා ගු රා
සක ත ව ත ත් වෙන් මිහිපුත් හ රා ව රා
අන ත රි වී ත් කිවි සිරිකත් ද රා ගි රා
රකි ත දිසෙත් මේ මුරු අප ක රා කි රා

3 ද ද පබු දනක් දෙත මම තුටුකර සත ත
න ද කර ලෙවන් ලොබගන්වා මෙ කව්වෙ ත
පු ද කල ලෙසින් කව්ගත් මමුව සතවෙ ත
ප ද බැඳ කියම් **"හෙළදිව් අබිදාන ම ක"**

4

බුදුන්ට නම්......මුනිඳු, සතර, මරරුපු, දිනිඳු, මොනැදු රු
සමතැස්, පසැස්, දියබප්, ලොවග, බව දු රු
කරදම්, සමන්, දියනා, සුගත, ලොවැ දු රු
දම්රජ, ජිනා, තිලොනා, (නම් තිලෝ ගු රු

5

(මෙනම් දසනවය හැමබුදුවරහට මා)
අප බුදුන්ට.......ගොතම, මහාමායාතොණෙන්, සැසී, (පෙ මා)
සුදැවුන්නිරිඳුපුත්, (හට වේ මෙසිව් න මා
අපමුනිඳුගෙ නම් අදහනු සැකය නි මා)

6

මහා බ්‍රහ්මයාට } ...සතත, බරම්, සිව් වත්, විදි, ලෝ ඇදූ රු
තිවට, පියුම්නැබ, අටනෙත්, විදු ඇදූ රු
මලස්, සිව්ගහන්, අටකර (වෙද ඇදූ රු
මෙනම් දෙළස මහබඹුවෙනට පලකෙ රු

7

විෂ්ණුට ..........ගවුපල්, බලිසතුරු, වෙන්, සළුකුනු, උව් ඳු
දත්වාසතුරු, වස්දෙව්, මෝදර * ගොවි ඳු
තෙව්කුම්, නරකාරිඳු, මල්නැබ, හිමි හලි ඳු
කමල්කල්, තිලඟ, දදගුරුළිඳු, උරි ඳු†

8

හොක්වෙස්, පියුම්නැබ, හරි, නීලඹර (මේ න මී)
නරසී, (මෙනම් විසිදෙක විෂ්ණුට නිය මී)
මහකෙල නාගාට } ......නානත, අනත, කොඩලිඳු, කොදසව්, (මේ න මී)
නොක්නෙත්, සහස්මුව, අහිපති, නරද, (න මී)

9

ඉරුට..............ඇදිලිකර, දිවයුරු, ගහ, ගැමුණු (න මී)
ගිම්රුස්, දිනිඳු, නෙවසඳ, තික්රජ, (මෙන මී)
දවස්මැණ, හුනැස්, කිරන, රාසිහි මී
(මෙ කී මෙනම් දෙලොසම වෙයි ඉරුටහි මී)

10

සඳුට...............උළිඳු, ඔ, නුබන්, නිසපිය, නිසයුරු, (ද)
දදරද, කලානි, ගහරද, සසර, (ද)
සිසි, පිනිපා, සොම්, රජසක් තරුරද, (ද
මෙනම් තුදුස නිසයුරුහට කියනු බැ ද)

11

අඩසඳට..........කඩ, අඩ, කැබෙලි, සමහර, බාග, බිගලි, (ද)
ලෙහෙලි, දැලි, (මේ නම් අටම අඩස ද)
සඳමඩලට........මඩුළු, බිඹු, (මේදෙක නම් මඩලයට ස ද
මින්මතු අසව අඟහරුවගෙ නම් සබ ද)

12

කුජට..............කුජ, මිහිපුත්, දෙරනනෙනෙහ, මගුල්, රතඟ, (ද
මෙනම් පසම අඟහරුවගෙ නම්යි සෙ ද)
බුදහුට.......... ..සිසිපිත්, සොම්තන, (බුදහුට මෙනම් ල ද
නම් පිකවට මට නොකියන්න ඇ ද පැ ද)

13

ගුරුට ............සුරගුරු, බඹඇදුරු, දලනැණ, පැ හැ ග ද, (ද
මේනම් සතර සුරගුරුහට කිය සබ ද)
කිවිට ............කිදිනෙත් අසුරගුරු, එකනෙත්, කනු, කිවි (ද
මෙනම් පසම සිකුරාහට කියනු බැ ද)

---

* 'දමෝදර' පුරණ නාමාවලිය.

† ගවපල්, කමල්කල්, හොක්වෙස්, ගොවිඳු, (න මී)
තෙවිකුම, උවිඳු, දත්වාසතුරු, හිල්, (න මී)
නරසී, නරනාරිපු, නීලඹර, මෙත්, (මේ න මී)
වස්දෙව්, පියුම්නැබ, (මෙකී දෙතිස් න මී)-සම්හර

14

ශනිට................සෙනසුරු, නිලඟ, බුන්පද, 'රිවුවහන්, සො    ර
රිවිපුත්, පතඟ, (මේ නම් සතම සෙනසු    ර)
රාහුට..............පලඟ, තම, උරඟ, තොමරැස්, රජ අ සු    ර
(මේනම් පසම රාහුට කියනු පලක    ර)

15

කේතුට............බඹපුත්, කෙතු, නාතුනු, (කේසෙගතුගෙ    නා ම ය
මේනම් තුණ මිසක් වෙන නොලියම්    ම ම ය
ඒනම් නොලියන්ට හැබ කාරණ කි    ම ය
කීමට ගතනොහැකි දෙවියා නිසා    ම ය)

16

ඊශ්වරයාට.......තිගුණෙතත්, ඇදබරණ, * බුනා, වෙමෙහසුරු,    (ද)
රිසහිමි, වසත්නෙත්, පඬෙරඟ, ගඟ ද ර,    (ද)
සත්සළු, රුදුරු, විසෙයම න, සතුරු, ඉසුරු,    (ද)
වසන්, අසලකල, නිල්කට, සත්සද,    (ද)

17

සඳ කඩ, තිනෙත්, දලසඳ, හිගිනිවෙස්,    (න මි)
උරහර, ගවයහන්, දලසඳ, සෙමසලි,    (න මි)
තුන්කැල, තිවෙස්, ගජයහ (නම් තිලත්,    (න මි)
මේනම් විසි අටම ඉසුරුට පැවති    න මි)

18

බලභද්‍රයාට .......උවිදු බෑ, තලත්, මුසලත්, රෙහෙණ නෙ    න
බලදෙව්, දිනිඳු, (මේකී නම් සය ඇඳි    න
කවි නොමබිඳිනු සොඳ දෙයකට මිසඅගු    ණ
පොරනැදුරන් වදනකි හැබ සැක තුම    න)

19

අනංගයාට.......කුසුම්දුනු, කඳප්, කම්, උනඟ, මුව ර    ද
සමර, මීයහන් † විසෙයවග, මල් සරු    (ද)
කුනුහිරු, කුසුම්දද, තුනුසෙන් ‡ මලෙවිය    (ද)
වසතර. සරා, තුල්හිරු, රා, තුනු දද,    (ද)

20

ගණ දෙවි හට } ......එක්දත්, කරගහත්, ගහනත්, ලඹෝද    ර
විනා, තඅත්, වීගුරජ, අන්උවත්, සු    ර
ගජවත්, වතඟ, ලඹදර, (මිහිරිය රුදු    ර
ගණදෙවිහට නම දහගත් කිවිඇදු    ර)

---

* 'අඳුබරණ' පු—සා—
† 'මීගහන්' යනු ගණදෙවිහට. පු—සා—
‡ 'මීනගෙන්' සිදත්සගරා, පු—සා—

21

යමරජුට .........දහම්රජ, * දකුණු දසහිමි, කල්මර ද
(මෙ නම් තුණම යමරජුහට වෙයි සබ ද)
වෙසමුණිහට .....දනිඳු, උතුරු, (ද) දනද, කුවෙර, යක් ර ද
(මේ නම් පසම වෙසමුණිහට කියනු බැ ද)

22

කඳකුමරුට ......සරයොත්, සවත්, මහසෙත්, උමාපුත්, කා ද)
සෙදුලසත්, බරතුවත්, අඩයපිදර, දෙවි, (ද
තරණි, කුමර, බරතෙත්, සිකියහත්, (වැ ද)
මෙකී මෙනම් සෙදුලසම කුමරහට කා ද

23

සක්දෙවිහට ......පුරඳර, සහසැස්, විදුරවී, පෙරදිගුහි මි
බලරුසු, ඉඳුරු, මෙසිඳුරු, සුරපති (මෙ නා මි)
විදුරත්, විදුරදුත්, සකාඅත්, (මෙ හැ ම නා මි)
සක්දෙවිරජුට පැවසු එකොළොස් මෙ නා මි

24

සිරිකතට........ ,පියුම්කල්, පියුම්, වෙත්කල්, ( මෙනම් තු ණ
සිරිකතහට පැවෙතන නම් සිට පොර ණ)
බබදරුලියට ....බැරිණි, ගැබිණි, තණමා, (කි මෙනම් තු ණ
බබදරුලියට කී නම අදහත් සොඳි න)

25

වෙසඟනට.......පණවිණි, සලෙලි, † වෙසඟන, ගණිකාය (ය න
වේසාලිනට නම් හෙළබාසින් කිය න)
බාලකතට.......කුමරි, ලඳුරි, මදඳුරි, බැහැටිය, යෝ න
(සොළසින් බාල අඟනට මේ නම් කිය න)

26

එකහිමිඇති ලියට ...... } කුලවමි, කුලදු, එක්හැමි, පතිනි, (මෙසත ර
එකහිමි ඇති ලියට නම් දැනගත් මි තු ර)
නම ලියට........සුකක, සොඳුරු, (දෙක නමලියහට සොඳු ර
කිය වියතුනි හෙළදිව් බසට තෙණහැ ර)

27

හිසට... ........ මුදුන, සිරස, හිස, මස්තක, ඔළු, (මෙප ස
ඔළුවට පැවසු නම් දැනගත් සැකය පි ස)
නලලට..........කියඹු, නලල්, බහලුය, (මේනම් තොංලෙ ස
නලලට කියන නම් දැනගත් තොාව කුකු ස)

---

* 'දහ රජ' එළු අකාරාදිය. "
† 'සලෙලි' යනු යෞවනීත්ව, පු—භා—

28

බැමට..............බැම, බුරු, කුඩලි, (මේනම් තුණ බැමට න මි)
ඇසට,.............අකව, නුවන්, නයන, නෙත්, සක්, (මෙ න මී)
නාසට ...........නාස්, ගඟණ, නැහැ( නාසට කියන න මී)
තොලට,.........අදර, ලවන්, දත් අවරණ (තොලට න මී)

29

දත්වලට ,.........පබළු, දල, දසන්, (දත්වලට නම් මුස ද)
කණට ..............ඇස්පත්, සවන්, නදබඳ, සෝ, (කණට වෙ ද)
බෙල්ලට .........තුනුවට, උගුර, කර, බෙලි, බොටු, ගිව්, ගෙල, (ද
මේනම් සතම බෙල්ලට කී නම් තොවෙ ද)

30

ළැමට ...........උර, හද, ළැමඩ, පපු, සෝබද, පියබ දා, (ය)
ළැයද, ළැපැති, (මේනම් හදවත වෙ ද ය)
තනේට ..........පියඹුරු, තෙනෙත, තුඹුපල, (පලනම් ග ද ය)
ළැමපල, පයෝදර, පාංපල නන ප ද, ය)

31

බඩට................කුස, ගැබ, බඩ, උදර, (මෙ සතර බඩට න මි)
පෙකණියට .... ..නැබ, පෙකණිය, (මේනම් පෙකණියට න මි)
ලිඟුවට ............ලිඟු, මදමැදිරි, දද, උතු මත්, හදත් ( න මි)
මේනම් පසම ලිඟුවට පැවත එන න මි)

32

කලවට..........,උරු, වතොර, ලිඟුපාරුස, (මෙනම් තු ණ
කලවට නමැයි සෙලදිව් බාසින් කිය න)
දනහිසට..........දන, ජුමඩල, දනහිස, ඇටවතියි, (දූ න
කිය දනහිසට සිංහලබාසින් දෙඩ න)

33

කෙණ්ඩට .........ජත්ගා, කෙණ්ඩ, (මේ දෙක නම් කෙණ්ඩය ට)
ඇස්වට ...........පාකර, වලළුකර, ඇස්වට, (පාකර ට)
පතුලට ...........පතුල්, පාද පෙත, (මේදෙක පතුලය ට)
ඇඟිලි. ...........පදසා, පා, ඇඟිලි, කරසා, (අතැඟිල ට)

34

අතට..................අත, බුජ, බාහු, කර, තුතුසං, (නම් අත ට)
පයට ................පද, පා, සරණ, (මේනම් තුණම කකුල ට)
නියපොතුවලට...නක, නිය, (මෙදෙක නියපොතු නම් තුත්බස ට)
සියගතට,.........ඇඟ, ගත, සිරුර, තුනු, වෙර, (නම් සියගත ට)

35

දෙවියන්ට.........අමර, දෙව්, අජර, සුර, මුරු, (දෙවිය න් ට)
අසුරයන්ට ........සුරරුපු, අසුර, සුදදෙව්, (නම් අසුර න් ට)
යකුන්ට............කුවෙර, යක්, බූත, නරරුපු, (පිසසු න් ට)
රකුසන්ට,.........රකුසු, වවැස්, දලදල, (ඈ රකුස න් ට)

36

දෙව්ලොවට ......දෙව්ලෙව්, දෙව්විමන්, සුරලෙව්, අමරපුර ර
(මෙනම් සතර දෙව්ලොව්කෙවම පළ ක ර)
දිවබොජුනට.....දෙව්පං, සුරබොජුන්, දෙව්පාන, (අමෘත ර
මේකී මෙකම් තුණ දෙවියන්ගේ අහ ර)

37

නයින්ට..........උරග, බුජග, අහි, පණි, දිග, රකැස්, (න මි
මෙනම් සයම් උරගුන්හට පැවති න මී)
පෙණයට ........පෙණ, ඵබ්, (මෙදෙක පෙණගොබයට කියන න මි
මින්මතු අතව ගරඬින්හට කියන න මී)

38

ගරඬියාට .........අපංනිසුරු, තෙලෙස්, කගවනු, ගරඬි, (න මී)
ඇයාව,......... ...ඇටපල, වල්දිරන්, (කබ ඇයාට න මී)
ගුන්තෑවට.........හෙල්පස්, අලුරෝම, (ගුන්තැවංට න මී)
එළුවාට............එළු, අජ, නිවට, (මේපුණ එළුවාගෙ න මී)

39

දිවියට ............ගොරූපු, කබර, දිවි, කොපි, (දිවියාට න මී)
උගරට ............කරවැල්, වරා, (මේදෙක උගරාට න මී)
හාවාට,............රූපුකිම්කඳෙ, වටුමුව, සාවාට න මී)
මසුන්ට ...........දලුර, නිපා, පිනිපා, (දිගමසුන් න මී)

40

පක්ෂීන්ට..........විපක්, විහග, කගවී, විය, සකුන්, (න මී
මෙනම් හසම විහගුන්හට පැවති න මී)
සිවළුන්ට .........දඹු, කොට, පොතල්, කොරමුව, දුන්වකොට, (න මි)
වල්ගා, ඇසෙස්, (මේනම් සිවළුන්ට න මී)

41

වඳුරට.............කළු මුව, පවගු, ගොනගුල්, මලගි, වානා ර
කිවි, සාමුව, (මේනම් යනම වානා ර)
ලෙහෙනට........කලඳ, ලෙහෙනු, (මේනම් දෙකම, ගෙණ ගෑ ර
ලෙහෙනුන්හට කිය නියවතුනී පළක ර)

42

කගෙවීනට .......ගිරිපා, ගිරිසතුරු, කළුරූපු, දලුසි ග, (ය)
කගමුව, එකග, (මේනම් වේතුට ක ග ය)
පරෙවියට.........ගල්රූපු, රත්පාද, රැවිලප (එවිග ග ය
මෙනම් පරෙවිහට කිය කිවි පද ර ග ය)

43

කුකුලට...........තඹසිළු, බඹරු, කග, කුරු, සර, (මෙනම් ප ස
කුකුලන්හට නම් පෙරසිට පැවති බ ස
පුරවි } පරපුටු, රත්නුවන්, වනපිය, කලක බ ස
කෙවිලිහට } (මේනම් සතර පරපුටුහට ගෙණ පව ස)

44

ඇතුන්ට.........ඉබු, මතාවරණ, නා, ගජකුඹු, නීදූන්, (හ මි)
වරණ, මතඟ, පිනීපං, ගජ, හස්ති, (හ මි)
මෙනම් රුදුර හැමගජතුන්හට තිය මි
අකුස්සට.........අංකුස, අකුසු, හෙන්ඩුව, (අංකුසට හ මි)

45

ඇතිණිට.........වඩබා, කෙණෙර, තාලිය, පිනිපාලිය, (ද)
නෙතන, මදලි, මතාවරගන, (මෙනම් බැ ද
ඇතිනිට සලස්නා කිය හෙළුවට සබ ද)
ඇත්පැටවුන්ට...පොතක, නාලිතෙන, (ඇත්පැටවුන්ට මෙ ද)

46

සිංහයාට..........දත්රුපු, කෙසරු, නරදත්, ගජසතුරු, (හ මං)
බාසුරු, ගිරිනිවෙස්, මුවරද, (කෙසර හ මං
මේනම් සතම කේසරහට පැවති හ මං
මින්දන ඉගෙණ හෙළපද කියනු දද නී මා)

47

ගෝණුන්ට ......තඹපළු, දසන්, පල, සිගු දල, (ගෝණු හ මි)
ගිරවුන්ට.........තිවන, කිර, දලතුඩු, තිල්තුනු, (මෙ හ මි
ගිරවුන්හට පෙරසිට පැවත එන හ මි)
ඇටිකුකුළංට.....ගොළුනාද, රතැස්, තුනුතඹ, (ඇටිකුළුන් හ මි)

48

(බඹ සුර නරන් සිවුපං විහඟ දිග ස ර
ඈ අබිදන් කිමි නම් සන්සෙප ක ර
මින්මතු අරුතු රුක්ලිය නම්ම කවික ර
පටන් කැලරුක්ද ලිය කියමි ඈර ඈ ර)

49

කැලගසට.........පලසි, අනක්කන්, බඹරුක්, පලස, (හ මං
කැලගසට නම් දූනගන් සැකය නි මං)
උක්ගසට.........ඉක්, ඉඟු, උවගු, (උක්ගසට පැවසු හ මං)
අඹානාගසට.....(අත්තානාගසට ලෙව් පවසති) උමතු; (හ මං)

50

කරඳගසට........එක්බිජු, පැහැරිමුල්, (මේදෙක කරඳ හ මි)
ඇසලගසට.......එරහැඳි, සකරගුල්, රසනිඹ, ඇසල, (හ මි
ඇසලරුකට පොරණැදුරෝ පැවසු හ මි)
සියඹලාගසට ....කලහෙළි, යක්බීරු, (සියඹල ගස්ට හ මි)

51

කුඹුරුවැලට . ...කලිගන්, කුඹකිරුස්, එක්බිජු, කුඹුරු, (හ මං)
රුක්මල් . .......කඳමල්, මලිතිමල්, (රුක්මල් වලට හ මං)
කුඹුක්............කුඹුඹු, (කුඹුක්ගස දූනගන් මේක හ මං
සබඳ යෙහෙන් පඩුවෙවමින් දදය නී මං)

52

බිම්කොසඹගසට. කිරිහු, බූනිඹ, (බිම්කොසඹගට නාමං),
පුඹක්ගසට .......කරමුව, වණටාරු, (මෙදෙක ගස්පුවක් නාමං)
ඉඹුල්ගසට........හඟර, කිඹුල්රුක්, දියරුක්, (ඉඹුල් නාමං)
වැරල්ලගස.......(වැරල්ලයට) කට්ගෙහෙවෙලය, (කියන නාමං)

53

එතුවරණ........ලම්බි, ලෙංත්සුඹුළු, වෙල්ලොත්, තිරණ්, (නාමා)
වරණ එතු, (මෙනම් එතුවරණ ගස නාමං)
මිදෙල්ල..........තිසුළු, මුසලින්ද, නාසූප්, (මිදෙල් නාමා)
බුළු,................පතාකුරු, (මෙ නම කිය බුළුගසට යෝමං)

54

කොසඹගස.......බුරුපත්රුක්, පූසිඹ, නිඹ, (ගුසී මෙනම් කු ණ
කොසඹගසට පල කර කියති, ඇමතු න)
දෙල්ගස..........ලපුස්, හඹනු, (මෙදෙක දෙල්ගසට නම් දූ න)
හල්ගස............කැවිරුක්, තකරජ, කරසාකා, කිය න)

55

සඳුන්ගසට,.......උරපිය, මලදරුක්, නාවැසි, සුවඳ රු ක
(සඳුන්ගසට නම් දූතගත් නොවී සැ ක)
නෙළුම්මලට......කරතල, රිවිකුමුදු, සතපත්, පියුමුදු ක
(නෙළුම්මලට නම් දූතගත් කැතුව සැ ක)

56

පොල්ගසට.......නාකරුක්, තැඹිලි, මාරුක්, පුළුපු, ජල ප ල
තඹපිල්, නෙරළු, බෙරවාඹළු, කුකුස් ප ල
(මේනම නමය පොල්ගසටම නියම ක ල)
නියගලාවැලට...ගිනිසිළු, ගිනිමුවා, (නම් නියගලා වැ ල)

57

රත්පියුමට .......තඹුරු, තඹර, (දෙක රත්පියුමට න ම ය)
පිච්චමැලට.......දූසමන්, ජාතිපත්, (පිච්ච මේ න ම ය)
හෙලපියුමට......හෙල්මැලි, පියුම්, සතපත්, හෙලපියුම (ම ය
හස්නාමලක, (මෙනමත් රත්නෙළුම් ම ය)

58

එඬරුගසට .......පසගුල්, ගදඹ, කරපත්සා, (එඬරු නා මි
කවෙළු ............කාරුපු, කවෙළු, (දෙක ඉඟිනැම වලට නා මි)
කිරිකවෙළු .......කොක්රුපු, කිරිකවෙළු, (ගොඩකදුරුවට නා මී
මේනම් දෙකැයි හෙළු සකු දෙබසින් හඟි මී

59

පොලවට .........ඉල්, ගජමිචු, දුරු, මීගි, මී, දරණ, බි ම
දෙරණ, වසුන්දර, බූ, (මේ නම් දස ම
පොලවට නියම නම් අදහාගත හැකො ම
අන්තැතකින් නාසා අදහනු මෙහෙ ම)

60

මුහුදට.....දිලිරුස්, දලනිදු, මින්විසි, සතත, (නා මි
රුතඟ, උදදි, සමුදුර, රුවන කර, (නා මි
සිඳු මෙනම් අට මුහුදට පැවසූ නා මි)
රළට.........රළම්, උලෙලාල්, (මේනම් දෙක රළට නම්)

61

ගඟට.........වසා, ගජලි, නදී, නී, ඇලි, (ගඟට නා මා)
වතුරට........පැන්, දල, නී, රස, ජල, දිය, (වතුර නා මා)
වෙරළට........කෙළා, වෙරළ, (මේ දෙක වෙරළයට නා මා)
ඇ: පොකුණට..කුදුනි, (ඇලට) කුසකලය, (පොකුණට මෙ නා මා)

62

දේදුන්නට....ඉඳුදද, සපෙ, ඉඳුසැව්, සුරදුනු, (මෙ නා මා)
දෙව්දුන්නට කීනම් දනු සැකය නී මා
අහසට.......නබ, නුබ, අඹර, සක්මන්, දෙව්පත (මෙ නා මා
අහසට පැවසූ මේනම් දනු සැක නොම මා)

63

ලෝභයට.....ඉසුම්, මසුරු, (මේදෙක ලෝබයට නා මි)
ප්‍රමාදයට......පමා, ඉසි, (මේදෙක පරමාදයට නා මි)
ඉක්මනට....කඩිනම්, විගස, (මේදෙක ඉක්මනට නා මි)
ප්‍රසන්නතට...සුපසන්, පහන්, මනපා, (සතුටටද නා මි)

64

රජුන්ට........නරවර, දෙරණිසුරු, බූපාල, (රජුන් නා මි)
ඇමතින්ට.....කීකරු, ඇමති, කම්සිදු, (ඇමතිනට නා මි)
වස්තුවට.......වස්, දන, කෙළෙඹි, (මේනම් වස්තුවට නා මි)
රජමන්දිරයට..මන්දිර, රජගහ, වාසල්, (රජගෙ නා මි)

65

ගලට..........ගිරි, කුළු, ගඩ, ගුහා, නග, නිසල, අසල, (ස)
සෙගාඩු, පව්, (මේ නවය දනගනු ලොකු ගල, (ස)
එම ලෙනට ...ගිරිලෙන, සිනිවෙස්, බාසුරුවැසි, කුල, (ස
මේ නම් සතර ගල්ලෙනටම පළ කළ ස)

66

වැඳුමට.........නමකර, නමදු, (දෙක වැඳුමට නමුයි ද නු)
ළඟට ..........නිසන්, නිසල්, සමීපා, (ළඟට අදහ නු)
නිරන්තරයට..නිරතුරු නිබඳ, නිති, (නිරතුරට නම ම නු)
දුකට..........කවොසල් * කබළු, සෝ, (මේනම් දුකට ව නු)

---

* 'කවෝල්' සිදත්සඟරා.

67

සතුටට ........තුටු, සන්තොස, (ද) හදපිය, ඔකද, (මෙ සත ශ
භන්තොසයට ලෙව් පවසන නම් සොඳු ර)
ගෙට...........ගර, ගහ, නිවෙස, නිල, (ගෙට නම් මේ සත ශ)
ගෘහපතියට....ගහපති, නිවෙස්පති, ගරපති, (ගෙහැයි හ ශ)

68

ගිස්නට ......දල, දහණ, තලසත, ගැනි කල, (මේ න ම
මෙනම් පසම ගිස්නට කී නමුයි හැ ම)
ගිනිපුපුරට ....ගිනිමල්, පුපුරු, (ගිනිපුපුරට කියන න ම
ලිපට ..........උදුන්, බඳුවගණ, ලිප්, (ලිපට කියම ම)

69

දෙමාපියන්ට ...දෙගුරු, මෙව්, මැනි මව්, අමම, (මවු ව)
පිය, පා, තාත, අප්පට නම් සැමකුල ව)
සහෝදරයාට..සොහොයුරු, බෑ, සහෝදර, (එක කුසෙහි හ ව
මෙ නම් ඉපෙගෙණ මවු පියනම් තොදෙව් බෑ ව)

70

අකමැත්තට...නොකමැති, නොගත, නොවපිය, (මේ) එපා, (න ම
මෙනම් ඇතර අකමැත්තට කියන න ම)
අඩුහැකිදේට..නොවුතු, නොකඩ, පිරි, නොඅඩුව, මෙබව න ම
අඩුනැති දෙයට කියනා තෙපුලි දැනුමෙ ම)

71

තිප්පලි .........වගපුල්, කණ (දෙක තිප්පිලි නම් සොඳු ර)
පුරු...........මගද, පුරු, (ද මෙදෙක නම් අදහස් දෙදු ර)
අබ..............සිදුහත්, අබ, (ද) සායප, (අබටයි මිතු ර)
පෙරුංකායම්..සිඟු, සුග, පෙරුංකායම්, (නම් තෙමිස පෙ ර)

72

වී වලට........බැත, * වී, දත, (මේ නම් තුණ වී වල ව)
බොල්...........පොල්, බොල්, බෝරළු, රඩු, දැනගත් බොල්වල ව)
සෑල් ...........සාල්, සැබොල්, (සාලට නම් කොම විය ව)
ගිනිහලට......ගිනිහල්, උදුන්, (මේ දෙක නම් ගිනිහල ව)

73

සඟළුවාට......ශගල, සඟ, සබඳ, මිත්, (සහළුවන් හ ට)
සතුරාට........සතුරු, පසමිතුරු, රුපු, (නම් සතුරන් ව)
නෑයන්ට......සම්ගොත්, බඳුන්, (නම් දැනගත් නෑසින් ව)
සත්පුරුෂයන්ට..සජන, සපුරිස්, (ද නම් සත්පුරුෂ ග ව)

* 'බැත' කියන් ව්‍යවහාරයි.

74

ගුගුල් ........මැසිඳු, ගුගුල්, (කොල ලාකඩට කි නා මි)

ඉඟුරු ..........සාගර, මහොසු, (දෙක ඉඟුරට කියනා නා මි)

දෙවිදර ........දෙව්දුරු, සුරදුරු, (දෙව්දරට කි නා මි)

හෙළුඑහුනු ...ලසුනා, සුදුළූනු, (අදගත්) බොදුනු, නා මි)

75

සිත්තුරු ......දිවකැල්, කැමි, රග, (සිතුයරහට නා මය)

සිතුයම .........අලික්, සිත්, ඇලෙවු, සිතුයරකමට මය)

සොඹුරු ..... සම්කම්, සම්වරු, (සොම්මරුහට නා මය)

ලෝහොකුරු ..ලොහොකරු, ලොහොවරුන්, (ලෝකුරුවම නා මය)

76

බඩාළත්ම ......සුවරු, තුලාවරු, රණකරු, (බඩල් නා මා)

හීත්තෘවුත්ම ..නලවරු, නලාකරු, වේණය, (මෙතුන් නා මා

හීත්තෘඅගට කියනා නම පෙරසිව මා)

කිඩිවරුත්ම...කදුවරු, කිඩිවරුය, (කිඩිවරුහට නිය මා)

77

ලප්නාරා ......වෙල්ලත්තිරිග, ලප්නාරා බිජුපුර්, (මා

මෙනම තුනම ලප්නාරාවලට නා මා)

ඇඹිටිඹම ......දියසියඹලා, මෙනම ඇඹිටියට නා මා)

පලාවැත්ත....මිනම, (පලාමුත්වැත්තට කියන න මා)

78

වලාවැත්ත ...සුරියකාන්තා, දලපුන්; (වලා වැ ති)

කිඹුල්වැත්ත .තිල්වැල්, කිඹුල්වැති, (මේ දෙක කිඹුල් වැ ති)

මකුළුවැත්ත..කොතුරුබැදි, (කියකි ලවගැම මකුළු වැ ති)

පුස්වැත්ත.....පොල්පුනුපලා, (නාම දනාගන්නා පුස් වැ ති)

79

රත්තිඹුල්...., චනකර, දගන්, රත්තිඹුලට නාමයි හැ ම)

කලුවැල් .......කලුවැල්, අසල්, (දෙක කලුවැල් කියති මෝ ම)

හත්නැම ........නානුතිය, (මෙනම දනාගත් සොඳුර නැත් නෑ ම)

මින්මතු **"කියමි හෙළ නම"** හැරලාම ලෝ ම)

---

80 ස මි ස ද ප බ ල   ස ද පි ළි  ස ද  වි ය ත්   ස ද<br>
වි ය ස ද නි ක   ස ද ය බා ස ද  ද ම ල   ස ද<br>
ප වි ස ද කෙමලස්  ස ද දි වි  ස ද  වි යු රු   ස ද<br>
කැවි ස ද හෙ මු ත්  ස ද ර ළු  ස ද  ද අ සි   ස ද

81 ස තු ස ද වි ල ද  ස ද පි ළි ස ද මි හි ගු   ස ද<br>
ප මි ස ද හැ ඩු ඹු  ස ද අ ඹි ස ද අ වා   ස ද<br>
දෙවු ස ද ල කුණු  ස ද පු ව ස ද ද දු ලි   ස ද<br>
පු ල් ස ද අ න න  ස ද ර ති ස ද ද අ නු   ස ද

82 සල සද පිපි සද යව් දිය ද සඳුය සද
හවි සද වණිත සද දත් සද ගුකීලි සද
වැට සද කොවි සද යසෙත් සද සෝසු සද
මස් සද දිඹුල් සද වං සද දසුණු සද

83 ගුම් සද බුජග සද පුර සද කුකුළ් සද
දඹු සද දිමුත සද දඹු සද ගදත් සද
කෙඩ සද නාගුල් සද පිත් සද දමුන් සද
සි සද සසෙතග සද හිණි සද දපත සද

84 කීලි සද විශලි සද බුත් සද දදුරු සද
නිසි සද කිවි සද දඅව සද රවුළු සද
ගිජු සද ලබනු සද සත් සද කලද සද
වස් සද මිගිඳු සද වල සද දඹුඹු සද

85 ගුසි සද අඳුන් සද දුව සද සතර සද
මර සද අසල් සද තෙරස ද වැසත සද
මණ සද ඇදුරු සද හිස සද විසඹ සද
කොත්ස ද කතුරු සද කා සද දගිරි සද

86 ගණ සද සිතුරු සද දිව සද දලිය සද
වණ සද තැවිලි සද අත් සද (මෙ සව් සද
මෙකී සියලු සද සියඇ අදික සද
සිත්සෙ අසව "මෙන් මතු කියමි මෙව සද")

---

87 බුදු, සව්, මෙදෙක නම් අදහන්න සම සද
පබල, කිසල, නම් දූනගන් සබල සද
රුක්, පල, රකුස්, පිළියට වේය පිළි සද
විසකුණු, වියත්, දෙකටම නම් විශත් සද

88 රෝග, අහස්, වයසට, වේය විශ සද
රැක නිකා, පණර, කලදම, වේය ශිඛ සද
බාහු, බාග, මෙමදෙකට වේය බා සද
මරණ, මල, දෙකට වෙයි දනුව මල සද

89 පව්, ගිරි, කුළු, දෙකට සෙල සද යයි කීයනු
කොලෙස්, දුරු කෙලෙස් සද යයි දනා කීයනු
දිව, ජීවිත, දෙක දිව සද යයි කීයනු
මියුරු, මොහරු, මිහුරු සද යයි දනා කීයනු

90 කැටපද, පහණ, දපණ, මෙම දෙක කැට — ස ද ය
තිසුමය, ඉසමීමය, දනු එ කොමුණ් — ස ද ය
පැදි, සවි, මෙමදෙක නම් දතගන් රළු — ස ද ය
කඩුවට, සහළුවට, දනගත් අසි — ස ද ය

91 කොපුල්, යකු, දෙකට දතගන්න යකු — ස ද
විලියට, විලඳයට, වෙයි දනු, විලඳ — ස ද
පිළිරුකට, වෙනෙසට, වේය පිළි — ස ද
මිහිගුරුක, මිහිඟුබෙර, වෙයි මිහිඟු — ස ද

92 පමා, කත්, දෙකට නම වෙයි පමා — ස ද
කැඹුඹුරුකඹ, වෙයි දතගත් කැඹුඹු — ස ද
කප්, අඹරුක්, දිය, ලිඟ, කිඟනු, අඹ — ස ද
අවංගයව, අවඟුව, වෙයි අවා — ස ද

93 දෙඹරුක්, දිසිම, පිණුමට, දෙඹ — ස ද කි ග නු
සල්කුණු, ලකුණු, දෙකටම ලකුණු — ස ද වි නු
සෙතවද, ගිරා, දෙකිමම සුව — ස ද කි ග නු
දැළි, (සග) තෙළුඹු, දැලියට දැළි — ස ද කි ග නු

94 පකණද, උපුල්, දෙකටම වේ උපුල් — ස ද
තිහිමද දෙය, අකතහට, වෙයි අගන — ස ද
රතියව, රතිදෙවිට, දනු සබඳ රති — ස ද
අනුදූත, ගණත් වෙනෙසට වේය අනු — ස ද

95 බෙර, වෙනෙසට, පලයම, වේය බෙල — ස ද
පිපුන, පරණ, වෙනෙසට, වේය පිපි — ස ද
බඹගට, දැසිවයම, වෙයි දනුව විඳ — ස ද
රුක්වෙනෙසට, කඳුලම, වේ කඳුළු — ස ද

96 බැව, ලී, ලයට, සිලිලට, නමුදු හම — ස ද
කත්, වල්මී, දෙකටම වේ මඹිත — ස ද
දසරුවඩද, ඇත්ගට, වේය දත් — ස ද
උකුළු, බදුන්, මෙදෙකට වේ ඉකිලි — ස ද

97 පහණට, අබරණම, වෙයි දනුව වැම — ස ද
ගල්, මුසු, දෙකට වෙයි දතගන්න සොවි — ස ද
සෙතව, සිනයාත්, වෙනෙසට වේය සෙත් — ස ද
ගෝබර, වැල්වෙනෙසකට, වේ ගෝනු — ස ද

98 ඉස්, උඩු, දෙකම ඉවයි දැනගන්න මුල් ස ද
දිඹුල්, දඹුළු, දෙකටම වේ දිඹුල් ස ද
පවන්, වදන්, වැල්ලයට, වේය මා ස ද
සුන්; සුණු, දෙකට වෙයි දැනගන්න සුණු. ස ද

99 පදව, රළට, බඩු, ගිම්, ගොසට, ගුම ස ද
බුජඟගවද, අතවද, වේ බුජඟ ස ද
සාගර, ඇතුළුපුරයට, වේය පුර ස ද
කුකුළු, වැල්වෙගෙසුකුට, වේ කුකුළු ස ද

100 තුකිල්, රුක්වෙනෙසකුට, වේය දුඹු ස ද
මනස, විල, සිරිලකුඹු, වේ දිඹුන ස ද
සිවල්, රුක්වෙසෙසුකුට, වේය දුඹු ස ද
සුමලිගු, සලකුණට, වෙයි දැනු සඳුන් ස ද

101 මස්ලොඹු, දත්, බෙරම, ඉවයි දනුව ගෙඩි ස ද
තගුල්, වලග, දෙකට දැනගන් නගුල් ස ද
පිරුණු, කුසල්, මේදෙක දනුව පින් ස ද
ඇසිල්ල, සරද, සිත්, තපසි, මුනි ස ද

102 සුරද, සිසිලහට, සී සඳයයි කිය නු
තලට, ගෙගෙතුසුට, ගෙගෙ සඳයයි කිය නු
ලිණට, හිණිමගට, හිණි සඳයයි කිය නු
ඉපන, පුන, මේ දෙක කම සඳයයි කිය නු

103 අගයට, බිලිදෙයට, බිලි සඳම යයි ව නු
වියලිනැනට, වාලගු, විහෙලි සඳ ව නු
බිදුනුදේට, බුන්නට, බුන් නමුදු ව නු
අඳුරු, දෙදුරු, දුරවලු, දුරු සඳය ව නු

104 පළිරුව, රැ, මෙඅැ ඉඩුනි දනුව හිම ස ද
සිකුරු, පඩි, වඳුරු, හැමුටම මෙ හිමි ස ද
සඳසහර, සුදට, වෙයි දැනුගන්න අඹ ස ද
රුවුලට, රාවණහට, වේ රවුළ ස ද

105 සිගොන්, ලොල් වෙනසයකට, හමුදු හිඟු ස ද
නගුල්, උස්, මෙ නම් දෙක වේ උමතු ස ද
සුමන්, කොවුල්හුට, ද වෙයි සමිය ස ද
ලූනෙත, ලියන්තන්හට, නම් ගලෙ ස ද

106 දිය, වය, දෙකට වෙයි දූහගන්නා මිය  ශ් ද
ඉඳු, සී, හිරිඳුහට, දූහගත් මිණිඳු  ස් ද
අරණට, ජලඝ, රෝමට, වෙය මල,  ශ් ද
සෙස්නැනි හිසට, හැඩපළුවට, වේ බුඹු  ශ් ද

107 තුවගම, ගුජයන්ට, කැමතියටද, ගුණ  ශ් ද
අඳුනට, කුඹුස්ර්‍යකටද, වේ අඳුන්  ස ද
අකුරට, දූවට, ගුණයට, වෙය දූම  ශ ද
ගණනාට, මුනිඳුන්ට, සහරට, සතර  ස ද

108 බර  ස ද, හමුදුවේ, බර, විසි, දෙළොසය  ශ
අමල් ස ද, වේය, වෙත, ගිරිනීවෙසස්  ව
සතර ස ද, තෙලෙය, තෙරගට, හපසිවිර්  ව
මැණික ස ද, වේය, පිළියට, වැසහය  ව

109 හැරයට, බසට, දහමට, වෙය බණ  ශ් ද
ගුරු, සිරි, දෙකට, ගල්වද, වේ ඇඳුර  ශ් ද
ගින, කල වෙසෙසක්ට, දනු සනිය සිඹ  ශ් ද
සිහිනට, ඇළමහට, වෙසි දනු විසම  ස ද

110 සිරස, ද, ජයද, අව වෙසෙසට, සේ නම  ද
[illegible] සඳයට නම් දූහගන් සැකය සි  ද
අලම, දඹු වෙසෙසකට, වේ සකුරු ස  ද
අහසට, දිනට, මුදුනට, වෙය [illegible] ස්  ද

111 වළියට, පෙලම, යළි, දිවපුරුම, නම සේ  ද
වෙයි දූහගන් නිසවන් අයිනි සිම ස  ද
ගිණුමට, ඇවිපියට, පමණට, මෙ [illegible] ස  ද
සිකුරු ගහ, සුක්ල ගව, වෙයි සිකුරු ස  ද

112 දිවයින්, පහන්, සහරද, දිවස, දිව  ස් ද
ලියනට, වැලට, පවසා කියනු ලිය  ශ ද
සිලිලද, වලද, විශයාවට, දනුව වණ  ස් ද
වෙයි නිසමෙට දූහගන්නේ සැකය  ශ් ද

113 නැවිලි, කුකුස්, පසු නැවිලිය, නැමලි  ස් ද
ඇතුල, සොයනව, සිරුරට, අතට, අන්  ස ද
වෙයි දූහගන් කිවි ඇදුරෙණි සැක ප  ශ් ද
ඉනි පවසම මින්මතු සමික සද  ශ් ද

114. අවල අවල සුද රති සෙ ලී
කෝමලී බැගැපී මුවරද සෙ ලී
පෙහරළු බෙරළු මෙ දෙක තැ ලී
අඹළු සඳළු සඳ මිදු ල ලී

මේ ප්‍රථම පාදදී එක සව රූප අව්‍යපේත යමකයි.

115. පි ය පි ය ලිය ත්මපිය වෙ ත
පි ය පි ය ප ද සහ සිමි වෙ ත
හි ය හි ය විලසට තිම් සු ත
හි ය ක වි බල කිවි නිසා ව ත

මේ ප්‍රථම ද්විතීය පාදදී එක සවරූප අව්‍යපේත යමකයි.

116. පා පා පුර නරණ මෙ රු තු
පං පං තුරු අත්බක රු තු
පං පා පද අපා අ රු තු
පා ද ඇස බලත් මෙ රු තු

මේ ප්‍රථම ද්විතීය තෘතීය පාදදී එක සවරූප අව්‍යපෙත යමකයි.

117. පි යු ම තිනෙත් වලා පි යු ම
පි යු ම සැගවී දෙනකු පි යු ම
පි යු ම පුවද ජලධි පි යු ම
පි යු ම සරණ මහිණ පි යු ම

මේ චතුෂ්පාද දෘෂ්ට එක සවරූප අව්‍යපේත යමකයි.

118. දිනිදු දිනිදු මුනි දිවා සු රු
පිනාවන මන රුතු කිවි ව රු
දුනැඳින රුතු දදකම් දු රු
කර මනපින වච නිය මි රු

මේ ප්‍රථමපාදදී එක සව රූප අව්‍යපෙත යමකයි.

119. උපුල උපුල ගෙල් මැල් ගි ල
උපුල උපුල දෙක කොමැඹි ල
උපුල එලියකුර තල මු ල
විපුල මෙරුන බල සුවිසු ල

මේ ප්‍රථම ද්විතීය පාදදී එක සව රූප අව්‍යපේත යමකයි.

120. ද ග න ද ග න ගිනි පත් රැ ස
ද ග න දැ ග න ලෙමුදු සු බ ස
ද ග න ද ග න දත් අදග ස
ඇ දි න උ ග නු මෙරුත් යස ස

මේ ප්‍රථම ද්විතීය තෘතීය පාදදී එක සවරූප අව්‍යපෙත යමකයි.

121. පල පල සුව සුළඳ ලප ල
පල පල පිලියම කපුර ල
පල පල පුනවු දුකද ල
පල පල කනු රක්ෂා ක ල

මේ චතුෂ්පාදදී එකාකාර යමකයි.

122. තුනු තුනු තඹ වෙර ඇටිකු ළු
තොනා පුතුළු සොණි නාම ළු
තිමිය ආදි මහමසිඹු ළු
වදන ගෙයට තිඹිරි ගෙය ළු

මේ ප්‍රථමං ව්‍යපෙත යමකයි.

123 තුනු තුනු දෙක සුඩා තු නී
තුනු තුනු සෝසර ගැ නී
තැවිලි තපසදිය දුව නී
දූතගතු අබිදන් වියතු නී

මේ ප්‍රථම ද්විතීය පාදාදි ඒකාකාර යමකයි.

124 තුනු තුනුවග අගනගෙ ඇ ග
තුනු තුනුලිය උමාකතැ ග
තුනු තුනුයොන් මලෙවිගැ ග
බල හැම මේ යමකක ර ග

මේ ප්‍රථම ද්විතීය තෘතීය පාදාදි ඒකාකාර යමකයි.

125 පිය පිය තම පියව කැම ති
පිය පිය පද තම ගිමි වෙ ති
පිය පිය තණගා ලිය වෙ ති
පිය පිය ඇස බලන් මෙරැ ති

මේ චතුෂ්ක පාදාදි ඒකාකාර යමකයි.

126 ගණ ගණ සමුගිය ගජ ව ත
ගහන් සතර මහබඹු වෙ ත
ගල බෙල්ලට ගහ වෙ ත
හල දෙර අත්තස් පුර වෙ ත

මේ ප්‍රථම පාදව්‍යපෙත යමකයි.

127 ගහට ගහට දූකත් රැක ට
ගහට ගහට අහසත් ගෙ ට
ගදඹ එමතම නටන අග ට
ගදඹත් තම් එඩරු ගහ ට

මේ ප්‍රථම ද්විතීය පාදාදි අව්‍යපෙත ඒකාකාර යමකයි.

128 ගිරි ගිරි ශරඹින් ගිගු ම ට
ගිරි ගිරි ගල ගලහර ය ට
ගිරි ගිරි රද ගජ කෙසරු ට
ගිනි මල් තම් ගිනි පුපුර ට

මේ ප්‍රථම ද්විතීය තෘතීය අව්‍යපෙත ඒකාකාර යමකයි.

129 ගුරු ගුරු පිය සහ ගුරු ව රු
ගුරු ගුරු සුරගුරුත් අසු රු
ගුරු ගුරු දූඩිබවත් උගු රු
ගුරු ගුරු තුන්ලොවට ඇදු රු

මේ චතුෂ්ක පාදාදි ඒකසවරූප අව්‍යපෙත යමකයි.

---

මෙසේ ෂට්ත්‍රිංශත් ප්‍රභෙද අව්‍යපෙත යමක මුඛමාත්‍රයක් දක්වා
තදනුරූප ත්‍රිංශාක්ෂර විශෙෂයෙන්
දක්වන්නාහු "**අරුණු අඳුන්**" ඈ කීහු.

130 අරුණු, අඳුන් දෙක යුද හා දුන්න ට
අසි, අග, කඩුවට නොගොන් අභූසය ට
අසන්, අසල, මේ දෙකම සමීපෙ ට
අවුනු, ගොතනදෙය, අරුණු, වස්තුව ට

181 ඉ සුරු, ඉඳුරු, තියෙනෙත් පුරඳර හ ට
ඉ සි, තපසුන්හට, ඉක්මන් විග හ ට
ඉඳුරු, නැගෙනහිර, ඉරු, අතිස ස ට
ඉඳුවැල්, පෙනෙහලයි, ඉක් උක්ගස ය ට

182 උ රහර, රණසුයි, උමතු, විකාරෙ ට
උ රගු, නගින්මයි, උදලි * මුහුදු ට
උ පුල්, කොවටමුයි, උලැඟි, මුවුත්හ ට
උ බස, උතනි, දෙක ආදුර අකුර ට

183 එ රබදු; කැලයි, එරහැඳි ඇසල ට
එ ක්බිජු, කරදියි, එරවණ, ඇතුහ ට
එ ක්බඳු, කිවොත් එකලෙස සදිසෙ ට
එ ක්සත, කීබස ඉක්මන් කරණ ට

184 ඔ ලාරි, මහතුම, ඔකඳ, සිතාව ට
ඔ තප්, ඔසප්, දෙක බය හා කිල්ල ට
ඔ හොරි, කියන නම කරලන සළුව ට
ඔ ඝ, ඔෂ්ටය, වැඩිජල දෙතොල ට

185 ක ලස, කණක, කලගෙඩියට රුවණ ට
ක පණ, සිගන්තන්, කලණෙද්, රිදිය ට
ක නු, කීවොත් එකතෙනක් නොමැති හ ට
ක රසා, ඇඟිලියි, කරපෙත අල්ල ට

186 කි යඹු, තලල ගෙතුකෙස්සට න ම් වේ
කි නුමග, කිවොත් ගින්නට න ම් වේ
කි රි, කිරි, නම්දෙක ඇතු පඩු න ම් වේ
කී ර, කිවොත් ගිරවුන්හට න ම් වේ

187 කු රු, කැස්බක්ටයි; කු තෙළු, පොකුණ ට යි
කු ළු, ගිරිකුල ටයි; කු ඹු, හජතුන් ට යි
කු මුදු, ක කුල ටයි; කු තවු, බුලත ට යි
කු මුකු, පුවක ටයි; කු මරි බිලිඳි ට යි

188 කෙ ළි, කෝල ම ට යි; කෙළා, වෙරළ ට යි
කෙ ටෙරි, පොරවට යි; කෙණෙර, ඇතින් ට යි
කෙ ම, මල්කෙමිය යි; කෙහෙ, තියෙකෙස ට යි
කෙ ත්, කෝවක්ක යි; කෙසුරු, ලෝම ට යි

* 'උදලි' එළ—අ.—

139 කො කනද, කොණ, රත්පියුම් ගෙමුල්ල ම
කො බොල්, කොරටු, එළුවන් සහ සිවළු ට
කො බ, කොක්, උගරන් සුදුකොක්කුන් ග ට
කො ලඹුරු, කාකා, කොමලි, තරුණි හ ට

140 ගඟ මඟ, අහසට, ගවපල්, විෂ්ණු ට
ගඟු රදු, සඳුහට, ගජසිව්, පොළොව ට
ගඟු හව, මේ දෙක ඟගට සහ සරකු ට
ගඟ ගැනු, බානුට, ගණ, සෙනුව ට

141 ගි රිරදු, මහමෙර, ගිම්රැස්, බානු ට
ගි රා, වදනයට සහ ගිරවුන් හ ට
ගි රිවැසි, කෙසුරුම, ගිනි, රත්නිටුල ට
ගී, ගෝණුත්හට, ගිවය, බෙල්ල ට

142 ගු රුකිම්, * අඹුවට, ගුමු, නම අකුල ට
ගු රු ගුතු, පියහට මෙ නම ගුරුන්හ ට
ගු ම්, ගුළු, ගිස්මෙට සහ ගිලිනීම ට
ගු ණු, පසලොස්වක, ගුමු, කිය තැළුම ට

143 ගෙ හි, කිවත් තැළුමට නම ව ත් තේ
ගෙ ගි වරණ, බිත්තිය, ගේ, සුත ත් තේ
ගෙ ල, කී මෙනමත් තැළුමට ව ත් තේ
ගෙ ල, කී නම බෙල්ලටත් වැටෙ ත් තේ

144 ගො මැඩල, ගාලයි, ගෝරුපු, දිවිය ට
ගො ර, ගොමු, ලෙඩ සහ නම් ගස අදමට ට
ගො දුරු, පඹකාමෙට, ගොත, ගොළුව ට
ගො රොක්, මගළුහට, ගොනාගුල්, වඳුර ට

145 ත ලා, වෙරළ, තල, පියුම් විලට නා ම්
තු ඹුරු, තෙළුම්මල්, තණ, පගොදර නා ම
ත ම, නම, රාහුට, තර, රශ්මි නා ම
ත ලා, ගොඩැල්ලට, තඹපිල්, පොල් නා ම

146 ති සුලවියා, නම ඉසුරුට ව ත් තේ
ති ලත්, කිවත් ඔහුටමයි බොල ත් තේ
ති දසිඳු, සක්රදු, තිය, තුණව ත් තේ
ති යම්, යාමතුණ මිත් දැනග ත් තේ

---

* "ගුරුගිණි"—එ—අ—

147 තු නුයොත්, මල් මදනගෙ නම ව — ත් තේ
තු නුඅඩ, කිවත් ඔහුටම ව — ත් තේ
තු වර, තෝරගතමයි දූතග — ත් තේ
තු නුවග, ලදලියෙගම් බොල — ත් තේ

148 තෙ නුත්, හොරුන්වයි තොගෙත් පුතු — ත් වයි
තෙ මුව, කිවෝතිත් පුඩාව — ත් වයි
තෙ පුල්, වදනවයි; තෙර, මහළු — ත් වයි
තෙ මුත්, තෙමිමයි; තෙමර, ගිල — ත් වයි

149 තෝ ම, කීනම තොවුපලට අදහන — නු
තෝ නැති, කිවොත් ජලතලාවමයි ද — නු
තෝ මුරු, කිවොත් අනුනුවරට පලන — නු
තෝ සියොත්, කීනම කැඳැත්තට ව — නු

150 ද ලසඳ, ඉසුරුව; දහසැස්, පුරඳ — රේ
ද ලදරමරණ, ඔහුගේ මතව — රේ
ද ගත, කියන නම යමරජුගට ඇ — රේ
ද ගත, නමක් ගින්නට කිවූ පෙරදු — රේ

151 දි නිදු, කියන නම මුනිඳුග ඉරුග — ම
දි යතෙත්, ඉරුමයි; දිවුසමු උදය — ම
දී රි, දසිරියගව; දිරිකිය, එලිය — ම
දි යකස්, * පුඩා; දිය, කිය වතුර — ම

152 දු මියොත්, ගින්නට; දුලබ, නිවණේ — ග ම
දු ගතිය, නිරයට; දුමිඳු, බෝදි — ග ම
දු ලද, මෙනම පවසත් මිසදිටු — ග ම
දු කුල්, හීනකුල සහ සිල්නැති — ග ම

153 දෙ විලෝ, † අහසට; දෙවෙස්, වයිරය — ම
දෙ දුරු, මවුත්හට සුදු කළු දෙදුර — ම
දෙ තෙතෙනෙත, කුජයට; දෙරණය, පොලව — ම
දෙ වීදු, කියන නම වෙයි බකමූන — ම

154 දො ලසත්; කීනම කඳකුමරු ග — ම
දො ස, දොල, වයිරෙට සහ ආශාව — ම
දො ල, දොල, වනපෙද දියබස්නාව — ම
දො රල, දොරල, රළුනම එම රුකය — ම

---

* 'දීඝකප්' සෑම. † 'දෙමුලං'—එ—අ—

155 ත රඟ, අනඟහට; තකු, කිඹුලන් හ ට
ත රා තරාවලි, නම අතතා හ ට
තා ලි, ඇතින්නට; තා, ඊයත්තැ ට
තැ සී, වැසීමට; තැරඹු, බැළීම ට

156 ති සර, තිදුඅඹරු, නම සොරු හ ට
ති සත, * මූලාවට; තිවි, ගොඩියා හ ට
ති ජස්, † අසුණුහට; තිසත්, ශූපැද්ම ට
තී ක, නම වෙඳුනෙත් පසළොස් කලඳ ට

157 තු එද, මෙකී නම සොඳැගුත් බඩුව ට
තු වන් බරැති, නම කඳකුමරාහ ට
තු බ, නම අගසට; තුබවත්, සඳුහ ට
තු හුහු, නමක්හැබ ඇති ගෙරෙණුන්හ ට

158 තෙ ර, ‡ අකුලෙන් වැසිතිබෙනා පාර ට
තෙ එ, කියනා නම දුතාගත් ඩස්ස ට
තෙ එඹු, තෙළඹ්මයි දුනාගත් සහතු ට
තේ, කී පමණින් අඳගනු අලිය ට

159 තො ගොක්වෙහ, කියනා නම විණ්ඩු ට
තො මිතුරු, සතුරයි; තොරඹුරු, රහස ට
තො ලපා, කීවේ අපාගපුත් හ ට
තො සතුම්, නම අදහන් දෙමිනසය ට

160 ප ත්වා, පල, නයි සහ දුක්ඇතිහ ට
ප න, සෙනෙහසටයි; පුරතොර, වෙරළ ට
පු නකු, පදවි, මේනම් දෙක පුර ට
ප සර, වැලකීමය අදහන් තු ට

161 පා රස, කිරිබත; පාලු, රැකීම ට
පා මොක්, උතුමට; පා, අකුසලය ට
පා, කිරිවල නම; පාදපු, කකුල ට
පා ය, ලනුවෙනම; පාතැහැමින් පි ට

162 පි යගැට, හිණිමග; පියසෙ, මළුවෙ ත ම
පි එ, සාවාහට; තොමහොත් කොරුගෙ ත ම
පි වීතුරු, මනසට; පියවුරු, කන ත ම
පි ල්, මල්වලටයි; පිළි, ගෙඩියට ත ම

* 'තිසත'—එ—අ—
† 'තිදුන්' සැම, මෙය 'අසුන්ගේ සුතුපවියට' නම්—එළ—අ—
‡ 'තෙර' යනු අකුසල් වැලකීමට—එළ—අ—

163 පු ලි, වැලිවලනම; පුර, නුවරට තම
පු ෂ්, පුල්, පුබුදු, නණම පිපුන තම
පු ෂ්කර, නෙළුම්යි; පුගුල්, පුරුෂ තම
පු ත, දෑඹගස සහ නැවත කියන තම

164 පෙ ර, ඉදිරියටයි ගියදවසම තම
පෙ ර වරු, උදයම් කියති මෙරට තම
පෙ ර දිග, සක්දෙව්හට ජවසන තම
පෙ ර දිග, නැගෙනිර අදසටත් හිමි තම

165 පොං තල්, නමක් සිවළක්ට කියත් හැ බ
පොං පි, කීනම සත්සලයි බොලඳු හැ බ
පොං ලබිජු, නම රත්තරණී තොවත් මලං බ
පො කුරු, කියන නම ඇත්හොඹඅග තු බ

166 බ ඹසර, නවසුන් සහ අස්පූව හ ට
බ රමස්, මුවරුසී; බඹරු, කුකුළු හ ට
බ ඹනැස්, ගෙමැදම; බලං, කොංකුත් හ ට
බ ලදෙව්, විෂ්ණුට, බරත්, කුමර හ ට

167 බ දු, අසබදුවට සහ බාජනය ට
බ ඹ, උතුමන්හට; බඹුරු, වකුටුව ට
බ පු, බල, හියට අනිකොක බලය ට
බ දදර, කීනම සිත්ඇලවීම ට

168 බා රුසි, කීවොත් අහස්ගෙහේ න ම
බා හු, අතට නම; බාහුරු, හිරු න ම
බා න, බාග, දෙක ලනුවත් අඩු ක ම
බා ති, කීවොත් පටපිළියට න ම

169 බි ළිය, බිම්නා, ගැඩවිල්හුගෙ න ම
බි හිදෙර, තොරණට; බිම, පොළවට න ම
බි ජුපුර, ලප්නාරං; බිඹු, කොම න ම
බි සෙස්, * සමිපෙට; බිඳු, නම තෙපුල ම

170 බු ජග, නයින්හට තොහොත් අතට න ම
බු ජමුල, කීවොත් කිසිලිදේසක් න ම
බු දු, දකගැණුමට; බුදි, නින්දට න ම
බු නා, ඉසුරුට නොහොත් සකුගෙ න ම

---

* 'බිසොස්'—එළ—අ—

171 බෙ ක, මැඩියන්හට; බෙද, * ගල්ලෙන නම
බෙ මි, විවල නම, බෙලි, බෙලි ගස නම
බෙ හෙරු, බටුයි; බෙඩුවල, කොත්තේ නම
බෙ තු, ගල්ලෙනවයි; බෙලෙල්, බලේ නම

172 බෝ ගොඹු, කටුස්සොයි; බෝළ, වස්සත් ව යි
බෝ ර, මඩ වලවයි; බෝදුන්, බතය ව යි
බෝ කොල, පියුම්පෙති දෙමළින්තාන් ව යි
බෝ දුම, කිවොත් නම බෝගස ව යි

173 ම ලගි, මලවි, දෙක මල්සරුගේ න ම
ම ඩොරපියෝ, නම සක්දෙවිඳුගෙ න ම
ම ර ණය, යමරජු; මාරු, සුලන් න ම
ම හසෙන්, කීවොත් කඳකුමරුගෙ න ම

174 මැ ලි, † කිවොතින් අකමැත්තට න ම
මැ ණ, කියනා නම මිණට කියත් හැ ම
මැ ලයි, කීවොතින් ලාගෙඩියේ න ම
මැ ති කියාවිත් මවුහබ හැමගෙ ම

175 මා කි පමණින් සඳුහට අඳුන නු
මා කි මේකුර මවුහට කියව නු
මා රුන, කිකුරුතුණ සුලඟට ව නු
මා, කි සද්දේ මවම අඳුහග නු

176 මි ණිගොටු, ගණ්ඩාරයට පැවසු න ම
මි ගිසිය, ගණදෙවියාහට කී න ම්
මි තුරු, ගුරුගෙ නම තොහොත් ගහළු න ම
මි සර, කිවෝතින් සීමාවේ න ම

177 මි දුල, පැලදොර; මිණි, පොල්වට න ම
මි සුරු, මොණරු නම තොහොත් රසට න ම
මි රිගු, කිවෝතින් පිහිදියවල න ම
මි සඳිටු, කීවොත් තිත් දනහට න ම

178 මු හුනත්, ගණදෙවියාහට කී න මු
මු සලක්, කීවොත් බලදෙවිහුගෙ න ම
මු වනණ, කීවොත් මිරිගුජලේ න ම
මු පන්, කියන නම උත්පත්තියෙ න ම

---

* 'බෙසද' සිදත්—පු—කා—
†. 'මැලි' යනු අලසකම්ට—එළු—අ—

179 මූ දලිඳු, කීවොත් මහමෙර කී ය නු
මූ ඵල, කියන නම කොස්ගෙඩ කී ය නු
මූ සපත්, කීවොත්, සිහිනැත කී ය නු
මූ ග, කියන නම ගොළුවට කී ය නු

180 මෙ සිදුරු, සක්රජ් නම් දනග ල් ලං
මෙ තුඩු, කීවොත් මොණරුන් අදහ ල් ලං
මෙ වුම්දමය, රත්කෙලියයි ලො ල් ලං
මේ ර, කී පමණින් රායි බොල ල් ලං

181 මො නමුදු, නම මංගල්ලෙම කී න් ම
මො ස්, නිවණෙව් නම් තොරගෙන් උතුම් න ම
මො ද, කීවොත්කින් සතුටුකමේ න ම
මො හොල්, මොණහරු, මෝලත් පැබිසි න ම

182 මෝ දුර, යන නම වින්නුව කියඳ න
මෝ දර, ගඟදෙක හැලුනු තැ න
මෝ, කී එකකුර මුහුම පවස න
මෝ ඩ, කිමත් සත් සතර තොදත් දූ න

183 යම, කීවොත් යක්ෂ දකුණු දිසාව ට
යර, කියනා නම තීරතුරු කීම ට
යමරද, යමරජුගේ නමමයි ඇ ට
යක්රද, කීවොත් වෙසමුණියා ග ට

184 යා පනු, කුකුළෙයි, යා, යකාවට න ම
යා, යකාඛයමයි; යාග, කියන න ම
යා එ, මිකුරුකම, යහපත, සොඳ න ම
යා වක, කී නම සිහන අයගෙ න ම

185 යු නු, ඉක්මණීටයි; යුවති, තරුණි ව සි
යු ගපත්, කීවොත් කොබොලීල ගස ව සි
යු ද්ධ, කියනා නම සේවාකම ව සි
යු ගය, කීවොත් වියදඬු සහ දෙක ව සි

186 යෙ ල, කීවත් දෙකමයි අදහාග නු
යෙ හෙළි, කිවෝතින් ලේලිගෙ නම ව නු
යේ, කී පමණින් අගනව අදහ නු
යෝ දේ, කියන නම මෝරුවලට ග නු

187 යො ගඳ, කීවොත් සෝවාකම — වා
යෝ නී, කිවෝතිත් යවුවන ලිය — වා
යෝ ගි, කියාවීත් තාපස අය — වා
යෝ බිල, කීවොත් වෙරහව් අය — වා

188 ර ශ්‍ර, රශ්මියටය; රජස්, දූලිය — ව
ර සතල, නාලොව; රජ්රැක, අංසල — ව
ර ශ්‍රී, රජදූහට; රස, බුරු වූනය — ව
ර ණදිව, සිත්තරු; රහස, කෙඳුරුම — ව

189 රු මුවස, රුවසී; රුස, සමූහය — ව සී
රු ස්හිමි, ඉරුටසී; රුලි, වකුටුව — ව සී
රු හැනී, තරහුමසී; රුවූ, නාදය — ව සී
රු කවල්, කීවොත් රුකසිපි අය — ව සී

190 රා, රාගයටසී; රා, සිකුරා — ව සී
රා, සෙණහගනටසී; රාග, විරුහ — ව සී
රා, ගික්දරටසී; රා, රකුසා — ව සී
රා ජ, නිරිඳුටසී; රාසි, ලග්නෙ — ව සී

191 රි යහිමි, ඉසුරුබ; රිවිමග, අහස — ව
රි ය, නම රනසට; රිසි, කිය ලොබය — ව
රි ක්, නම රුකයට; රිළු, සේනාව — ව
රි යදර, * කියනා නම වෙයි මවුහ — ව

192 රු ච, ඉසුරාහුම; රුචකර, මුහුද — ව
රු සි, තාපසහට; රුප්‍ර, සතුරාහ — ව
රු වණ්අරුත්, නම මංගල රතය — ව
රු, රුපෙට නම; රුක්, නාම සෝකෙ — ව

193 රෙ ගුණතෙනා, නාම බුදුහුට කී — ය නු
බුල දෑවියාටත් මෙම නාම කී — ය නු
රෙ ගොවර, මංතිල් අලයට කී — ය නු
රේ මස්, කීවොත් ගගේ මසුන් — ද නු

194 රො ත්, නම දියබින්දුවට කියන — න ම
රො ත්, නම මල්රේනුවටත් කී — න ම
රො ද, කීවෝතින් ලදුවට කී — න ම
රො ශ්‍රී, රොත්, ගැලමත්; දූලිවලට — න ම

* 'රියදර' යනු වඩුවන්ව නම්—එ—අ—

195 ල මිග, ලතා, කුරැඳුත් සහ වැල්ප ව
ල පළු, දළුවටත්-නුමු කලගෙඩිය ව
ල ල, සත්සලයට; ලසුණු කැපීම ව
ල ද, ලමයින්හට සහ-ලජ්ජාව ව

196 ලැ ස්, කීවොතින් ගණු පරමාදෙ ව
ලැ මඩි, කිවොතින් අදහත් මනස ව
ලැ විදි, අනුන්හට; ලැවි, වැද්ද ග ව
ලැ මැ කීවොතින් නින්දිත කෙපුල ව

197 ලි යැව, කීවොත් අහංකාරය හ ව
ලි ය, කීවොතින් වැල සහ-අගන ව
ලි ය, කීනම නියතෙකී කස්තුරිය. ව
ලි ලා, සඳිසෙව; ලියුත් කැපීම ; ව

198 ලු ලු, කියනා නම ගත්සලයට ත ම
ලු හුඩු, කියන නම අඩුද ට කී ත ම
ලු හු, යන සද්දේ කඩිනම කී ත ම
ලු හුණු, ලසුණුකොට පිළිපෙරළු ත ම

199 ලෙ ඩ, නම ගිලනට සහ-ගල්ලෙනය ව
ලෙ වැදුරු, නම මුදුනුත්-මහබඹුහ ව
ලේ කම්, ලියුමට; ලිපිවරු, ලිවුහ ව
ලේ පය, කීවොත් ගණු අලෙපේ ව

200 ලොවැදුරු, කීවත් අදහනු මුනිඳු ව
ලෙව ම නම පලකර කිව් මහ බඹුන ව
ලො පොත්, ලොනීස, නම් දෙකබ බූමිය ව
ලො නොවරු, ලෝකාරු, කිය ලෝකුරුහ ව

201 ව හර, කීවොත් වැස්සට අදහ ත් තේ
ව ලදට, සලකුණු, නම දූත ග ත් තේ
ව දත, කීවොත් තෙදුල වයි බොල ත් තේ
ව රණ, කීවොත් එණුවරණැරුන ත් තේ

202 වා ඊවූ, කීනම අදහන් අහස ව
වා කීපමණින් මදිවද සුලග ව
වා සර, අව්වට; * වාසල, රජගෙ ව
වා සු, පදය වස්සත් සහ පොළව ව

---

* 'වාසර' අවුරුද්දට සහ දවසටද නම්—එ—අ—ශ—ළු—

203 වැ දූරු, නම වෙයි කියාපු තෙප්පුල ව
වැ කොඳ, කීවොත් තෙරිඇට වැල්ප ව
වැ රැණකය, වෙයි කොට්ටු ශරීරෙ ව
වැ වර, කීවොත් ලා පොල් පලශ ව

204 වි දූරවී, කීවොත් සක්දෙවියා හ ව
වි ජයොත්, නම වෙයි ඔහුගේ පා ශ ව
වි ගුරජ, කීවොත් ගණදෙවියා හ ව
වි ජිතය, කී නම වෙයි සිය නුවර ව

